කාර්යාල නියෝග 11/2021

මගේ අංකය: RG/AB/01/චක්‍රලේඛ හා කාර්යාල නියෝග
පාලන අංශය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.
2021-05-04 වෙනි දින.

අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්
ප්‍රධාන ගණකාධිකාරී
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන/සිවිල්/නොතාරිස්)
මධ්‍යම ලේඛණාගාරය/ කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්

**කොවිඩ්-19 වසංගත තත්ත්වය තදින් පැතිර යාම හේතුවෙන් රා.ප.චක්‍රලේඛ 02/2021(1) අනුව නිකුත් කල දෙපාර්තමේන්තු කාර්යාල නියෝග 10/2021 මගින් පනවන ලද නියෝග සංශෝධනය කිරීම**

කොවිඩ්-19 වසංගත තත්ත්වය තදින් පැතිර යාම හේතුවෙන් රා.ප.චක්‍රලේඛ 02/2021(1) අනුකූලව නිකුත් කල දෙපාර්තමේන්තු කාර්යාල නියෝග 10/2021 හා ඒ සම්බන්ධයෙන් කටයුතු කලයුතු ආකාරය පිළිබඳව ම' විසින් නිකුත් කල අංක:RG/01/පොදු/2021 හා 2021-04-29 දිනැති ලිපිය හා බැඳේ

02. එක්දින සේවාව (පත්ඉරු/ඔප්පු/ඇටෝර්නි බලපත්‍ර සහතික පිටපත් නිකුත් කිරීම) සහ මෙයට සමගාමීව සාමාන්‍ය සේවා 2021-05-05 දින සිට 2021-05-13 දින දක්වා නැවැත්විය යුතු අතර, මේ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමට පියවර ගත යුතුය. තවද, එම කාල පරාසයේදී මෙතෙක් එකතු වී ඇති වැඩකොටස් නිමාකර ගැනීමට කටයුතු කළයුතුය.

03. සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද තරයේ අනුගමනය කළයුතු අතර, තමාට පැවරෙන මුර ක්‍රමය අනුව සේවයට වාර්තා කලයුතු අතර, හදිසි රාජකාරි අවශ්‍යතාවලදී දැනුම්දීම මත ආයතන ප්‍රධානියාගේ අභිමතය පරිදි කටයුතු කලයුතු ය.

04. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නිරත නිලධාරීන් දිසාපති/ප්‍රාදේශීය ලේකම්ගේ අභිමතය පරිදි දෙපාර්තමේන්තු නියෝග සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සේවයට වාර්තා කල යුතුය.

05. හදිසි අවශ්‍යතාවයකදී ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ මා දැනුවත් කළයුතු අතර, 10/2021 කාර්යාල නියෝගයේ අනෙකුත් විධි-විධාන එලෙසම ක්‍රියාත්මක බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

06. කෙසේවුවද, ඔබ විසින් ගන්නා ලද ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුව හැකි සෑම අවස්ථාවකදීම මහජන සේවය ඉටුකිරීමට වගබලා ගතයුතුය.

ඩබ්.එම්.එම්.බී.වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

පිටපත:

- ලේකම්
  රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

ඩබ්.එම්.එම්.බී.වීරසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
නො.234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.